**මධ්‍යම පළාත් සභාවේ කඩුගන්නාව නගර සභාවේ ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම.**

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ කඩුගන්නාව නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ වසර තුනකට නොඅඩු ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | ශ්‍රේණිය | සේවක ගණය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | සුදුසුකම් /අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| (01) වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 111 | ප්‍රාථමික ශිල්පීය නොවන | 02 | රා.ප.ච. අංක 3/2016<br>PL-01-2016<br>රු. 24,250-10x250-10x270-10x300- 12x330- රු. 36,410<br>මුල් පත්වීමේ දින සිට රා.ප.ලේ. 3/2016 II උපලේඛනය පරිදි රු. 19,242/- වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | I . දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යනය පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙන් විෂයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු ය. මින් විෂයන් 05ක් එකවර සමත් විය යුතු ය.<br>II. ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොසිටියහොත් අධ්‍යාපන සුදුසුකම 5 ශ්‍රේණිය සමත් වීම දක්වා අඩු කරනු ලැබේ. |
| (02) සෞඛ්‍ය කම්කරු | 111 | ප්‍රාථමික ශිල්පීය නොවන | 06 | රා.ප.ච. අංක 3/2016<br>PL-01-2016<br>රු. 24,250-10x250-10x270-10x300- 12x330- රු. 36,410<br>මුල් පත්වීම් දින සිට රා.ප.ච.ලේ. 3/2016 II උපලේඛනය පරිදි රු. 19,242/- වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | I. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යනය පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙන් විෂයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතුය.<br>මින් විෂයන් 05ක් එකවර සමත් ව තිබිය යුතු ය.<br>II. ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොසිටියහොත් අධ්‍යාපන සුදුසුකම 5 ශ්‍රේණිය සමත් වීම දක්වා අඩු කරනු ලැබේ. |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

I. මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

II. පුරප්පාඩු වී පවතින තනතුරු සංඛ්‍යාවට සමාන වඩාත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණය බඳවා ගනු ලැබේ.

III. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. පත්වීම ලබා මසක් ඇතුළත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරිදි ප්‍රතිඥා/දිවුරුම් දී අත්සන් කළ යුතුය. එසේම එහි IV වැනි පරිච්ඡේදයේ සඳහන් භාෂාව පිළිබඳ විධිවිධාන පිළිපැදීමට බැඳී සිටිය යුතු ය.

III. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම පළාත් සභාව හෝ කඩුගන්නාව නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි සහ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

IV. තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්වයක නොමැති වුවහොත් සේවය අවසන් කරනු ලැබේ.

V. දැනටමත් මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් පමණක් එක් අවුරුදු පරීක්ෂණ කාලයකට යටත් වේ.

04. *වෙනත් සුදුසුකම් :*

I. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

II. දැනට කඩුගන්නාව නගර සභාවේ තාවකාලික/ අනියම්/ආදේශක පදනම මත සේවයේ නියුතු සේවකයින්ට වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

III. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු ය.

V. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට කඩුගන්නාව නගර සභා බලප්‍රදේශය තුළ අඛණ්ඩව යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.)

VI. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

VII. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.

VIII. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් සම්පූර්ණ කර තිබිය යුතු ය.

05. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2018 සැප්තැම්බර් 25 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''ලේකම්, කඩුගන්නාව නගර සභාව, කඩුගන්නාව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) අයදුම්පත ඒ4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම භාවිතා කළ යුතුය.) අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම, සංශෝධනය කිරීම ආදි සියලු බලතල කඩුගන්නාව නගර සභාවේ ලේකම් සතු ය.

ඩී. එම්. පී. කේ. දිසානායක,<br>
ලේකම්,<br>
කඩුගන්නාව නගර සභාව.

2018 අගෝස්තු මස 31 වැනි දින<br>
කඩුගන්නාව නගර සභා කාර්යාලයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම.*
*කඩුගන්නාව නගර සභාව*

........................................................ **තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :- ................................................................................................
මුලකුරුවලින් හැඳින්වෙන නම් :- ................................................................................................

02. i. ස්ථිර ලිපිනය :- ................................................................................................
ii. දුරකථන අංකය :- ................................................................................................

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ................................................................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය :- ................................................................................................

05. උපන් දිනය: වර්ෂය :- ........................... මාසය:-............................ දිනය:-..................................

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස:- අවුරුදු:-......................... මාස:-............... දින:-.......................

07. ස්ත්‍රී/පුරුෂභාවය :- ................................................................................................

08. විවාහක/අවිවාහක බව :- ................................................................................................

09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග:-

10. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. සා.පෙළ විභාගය :

සමත් වර්ෂය:- විභාග අංකය:-

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 01. | | 05. | |
| 02. | | 06. | |
| 03. | | 07. | |
| 04. | | 08. | |

11. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම්:-
(ii) වෘත්තීය සුදුසුකම්:-
(iii) සේවා පළපුරුද්ද:-

12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේනම් දැනට දරන තනතුර:- ..................................
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශකද යන වග :- ..................................................

එම තනතුරට පත් වූ දිනය:- ..................................................

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ..................................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම භාර ගනු ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

.........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය:-..........................

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ ඉල්ලුම්කාරිය වන ..................................................................................................මහතා/මහත්මිය/ මෙනවිය මෙම ආයතනයේ ....................................කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. ඔහු/ ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

............................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :- ........................................................
තනතුර :- ........................................................
ආයතනය :- ........................................................
දිනය :- ........................................................

08 -1221